ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය

**කොළඹ**

පුවත්පත් නිව**ේදනය**

<u>ඉන්දීය රැල්ලනේ ඉදිරියට යමින්: **ලොව** පස් වන විශාලතම **ආර්ථිකය** ශ්‍රී ලංකාව අභිමුව</u>

‘ඉන්දීය රැල්ලනේ ඉදිරියට යමින්: ලොව පස් වන විශාලතම ආර්ථිකය ශ්‍රී ලංකාව අභිමුව’ යන තේමාව යටතේ පවත්වන ලද සම්මන්ත්‍රණයක් අද දින කොළඹ ITC රත්නදීප හෝටලයේ දී පැවැත්විණ. මෙම සම්මන්ත්‍රණය වෙරිටේ රිසර්ච් ආයතනය විසින් කොළඹ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සහ හෝලීස් ඇඩ්වාන්ටිස් ආයතනයේ සහයෝගය සහිතව සංවිධානය කර තිබිණ.

2. දවස පුරාම පැවති සම්මන්ත්‍රණය සැසි තුනකින් සමන්විත වූ අතර එහිදී ශ්‍රී ලංකාවට සිය අපනයන ඉහළ නැංවීම, ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ තිරසාර ආර්ථික ප්‍රතිසාධනය ළඟා කර ගැනීම සඳහා ගෝලීය ආර්ථික බලයක් ලෙස නැගී එන ඉන්දියාවට ආසන්නව පිහිටා තිබීම මූලෝපායිකව ප්‍රයෝජනයට ගත හැක්කේ කෙසේද යන්න ගවේෂණය කරන ලදී.

3. ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් වෛද්‍ය සත්‍යාංජල් පාණ්ඩේ මහතා පිළිගැනීමේ කතාව සිදු කරමින් විවිධ අංශවල ඉන්දියාව ලබා ඇති දියුණුව කලාපීය සෞභාග්‍යයට දායක කරගත හැක්කේ කෙසේද යන්න ඉස්මතු කර දැක්වීය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට තාක්ෂණය, ලොජිස්ටික් සහ කුසලතා සංවර්ධනය යන ක්ෂේත්‍රයන් හි ඉන්දියාවනේ අවස්ථා උකහා ගත හැකි බව එතුමා සඳහන් කළේය.

4. අනතුරුව විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍ය අරුන් හේමචන්ද්‍ර මහතා විසින් ප්‍රධාන දේශනය පැවැත්වීය. එහිදී එතුමා ඉන්දියාවේ නැගී ඒමෙන් ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින විශේෂ සබඳතා අනන්‍ය ශක්තියක් වන බව අවධාරණය කළේය. ඉදිරියට යාමේදී ඒකාබද්ධ සමාගම් අතිශයින් වැදගත් වන බව සඳහන් කළ එතුමා ව්‍යවසායකයන් සහ නවෝත්පාදකයන් මෙම පොදු ගමන් මඟේ පුරෝගාමීන් වන බව ප්‍රකාශ කළේය.

5. දෙමුහුන් ආකාරයෙන් පැවැති සම්මන්ත්‍රණය සඳහා ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති සම්පාදකයන්, කර්මාන්ත නායකයන්, ආර්ථික විද්‍යා

ප්‍රවීණයන්, විද්වත් මණ්ඩල සාමාජිකයන් සහ මාධ්‍ය ප්‍රජාවේ සාමාජිකයන් සියයකට අධික පිරිසක් සහභාගී වූහ. සම්මන්ත්‍රණයේ සවිස්තරාත්මක න්‍යාය පත්‍රය https://www.veriteresearch.org/events-riding-the-indian-wave-regional-conference/ තුළින් පරිශීලනය කළ හැක.

6. මෙම සම්මන්ත්‍රණය ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරිත්වය තවදුරටත් ශක්තිමත් කිරීම, අනාගත මාර්ග සිතියම සකස් කිරීමෙහිලා දෙපාර්ශ්වයේම ප්‍රජාවේ නියැළීම පුළුල් කිරීම සහ දෙරට ජනතාව අතර අන්‍යෝන්‍ය විශ්වාසය සහ හොඳහිත වර්ධනය කිරීම සඳහා නිල සහ නොනිල අර්ථාන්විත සාකච්ඡා සහ සංවාද දිරිගැන්වීමට සහ ප්‍රවර්ධනය කිරීමට ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් ගනු ලැබූ තවත් පියවරකි.

***

**කොළඹ**
***2025*** මාර්තු ***27***